නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය

පුරප්පාඩු

ව්‍යාපෘති විස්තරය :

01. කොළඹ ජාත්‍යන්තර මූල්‍ය නගර ව්‍යාපෘතිය (වරාය නගර ව්‍යාපෘතිය) ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය (ශ්‍රී ලංකා රජය වෙනුවෙන්), නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සහ CHEC Port City Colombo Pvt. Ltd.(ව්‍යාපෘති සමාගම) යන පාර්ශව තුන අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් අත්සන් තබන ලදී. මෙම ත්‍රෛපාර්ශ්වික ගිවිසුම යටතේ, ශ්‍රී ලංකා රජයට විශාල වගකීමක් සැවරේ. ශ්‍රී ලංකා රජය වෙත සැවරෙන වගකීම් සම්බන්ධීකරණ, කළමනාකරණය, නිරීක්ෂණය සහ අධීක්ෂණය සඳහා අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් පිහිටුවන ලදී.

02. පිරවීමට නියමිත පුරප්පාඩුව පවතින තනතුර :

තනතුර	පුරප්පාඩුව පවතින තනතුරු සංඛ්‍යාව	01/2019 චක්‍රලේඛය අනුව වැටුප් කාණ්ඩය
1. ව්‍යාපෘති ගණකාධිකාරී	01	PS-4
2. කළමනාකරණ සහකාර	01	
3. ගිණුම් සහකාර	01	

03. රාජ්‍ය කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 01/2019 අනුව, ඉහත තනතුරු සඳහා අයදුම්කිරීම සඳහා සුදුසුකම් ලැබීමට පහත සඳහන් සුදුසුකම් වලින් එකක් සපුරා තිබීම අවශ්‍යවේ.

අංකය	තනතුර	වැටුප් කාණ්ඩය	සුදුසුකම
01	ව්‍යාපෘති ගණකාධිකාරී	PS-04	(පහත 01 හෝ 2) (01) විශ්වවිද්‍යාලප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ අදාළ විෂය ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක් හෝ අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගන්නා ලද ආශ්‍රිත සාමාජිකත්වයක් /සමාන වෘත්තීය සුදුසුකමක් සමග සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 9 ක පළපුරුද්දක් (02) රජයේ දීප ව්‍යාප්ත සේවාවක III/IIවන පන්තියේ හෝ ඉහළ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයක් තිබීම සමග III/II වන පන්තියේ තනතුරෙහි අවම වශයෙන් වසර 09 ක පළපුරුද්ද
02	කළමනාකරණ සහකාර ගිණුම් සහකාර		(අ) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. සහ (ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පෙළ) පොදු පරීක්ෂණය හැර එකවර සමත්ව තිබීම. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනුමක් ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ

04. **සාමාන්‍ය කොන්දේසි :**

අයදුම්කරුවන් වයස අවුරුදු 65 කට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

05. **වැටුප :**

2019.03.15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 සහ අනෙකුත් අදාළ කළමනාකරණ සේවා චක්‍රලේඛවල සඳහන් පරිදි වැටුප ගෙවනු ලබන අතර, එයට අතිරේකව, එකී චක්‍රලේඛයේ සඳහන් දීමනා සහ වරප්‍රසාද වලට හිමිකම් ලබයි.

06. **අයදුම් කිරීම සඳහා කොන්දේසි :**

රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2009 හි 2.3.3 වගන්තියේ (ආ) ඡේදය අනුව අයදුම්කළ හැකි අතර, රජයේ සේවකයන් නොවන අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබේ. රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා සිය අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

07. **අයදුම්පත් :**

සුදුසුකම්, පළපුරුද්ද සහ දුරකථන අංකය හා විද්‍යුත් ලිපිනය (තිබේ නම්) ඇතුළු අනෙකුත් අදාළ තොරතුරු සහිතව A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන ලද අයදුම්පත් 2021.03.01 දිනට හෝ එයට පෙර පහත ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, රජයේ / රාජ්‍ය -නොවන ආයතනවල අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර සාජුව ඉදිරිපත් කරන අයදුම්පත් පහත ලිපිනයට එවිය යුතුය.

විධායක ව්‍යාපෘති කළමනාකරණ අධ්‍යක්ෂක
නාගරික සංර්ධන හා නිවාස අමාත්‍යාංශය
8 වන මහල, "සුහුරුපාය",
බත්තරමුල්ල.

Source: Silumina, Sunday Observer (2021.02.14)